# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1997 අංක 22 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1997 අගෝස්තු මස 12 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 අගෝස්තු මස 15 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 3.40 යි.** **තැපැල් ගාස්තුව : රු. 2.50 යි.**

**1997 අංක 22 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1997 අගෝස්තු මස 12 වන දින]

එල්. ඩී.–ඕ. 3/94.

**1982 අංක 9 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 1997 අංක 22 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1982 අංක 9 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පනතේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :– 1982 අංක 9 දරණ පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "මුදල් හා ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයාගේ" යන වචන වෙනුවට "ස්වදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ඈ) ඡේදයේ "සැලසුම් ක්‍රියාත්මක කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ" යන වචන වෙනුවට "මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ" යන වචන වෙනුවට "ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයාගේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "ස්වදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ" යන වචන වෙනුවට "උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ උපවගන්තියේ (උ) සහ (ඌ) ඡේද ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :–

"(උ) තත්කාලයෙහි පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ධුරය දරන තැනැත්තා ;

2—D044912—5,900 (97/05)

(ඉ) අමාත්‍යවරයාගේ මතය අනුව පෞද්ගලික අංශයෙහි කළමනාකරණය පිළිබඳව විශිෂ්ටත්වයක් ලබා සිටින තැනැත්තන් දෙදෙනෙක් :

(එ) අමාත්‍යවරයාගේ මතය අනුව රාජ්‍ය අංශයෙහි කළමනාකරණය පිළිබඳ වැදගත් ස්ථාන දරන හෝ දරා සිටි තැනැත්තන් දෙදෙනෙක් :

(ඒ) තත්කාලයෙහි ආයතනයේ අධ්‍යක්ෂ ධුරය දරන්නා වූ ද පාලක සභාව කැඳවන්නා ලෙස ක්‍රියා කළ යුතු වූ තැනැත්තා :

එසේ වුවද මේ උපවගන්තියේ (අ) සිට (උ) දක්වා ඡේදවල නිශ්චිතව සඳහන් විෂයයන් දෙකක් හෝ වැඩි ගණනක් එක් අමාත්‍යවරයකුට භාර කර ඇති අවස්ථාවක, අමාත්‍යවරයා විසින් පළමුවෙන් සඳහන් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට අතිරේකව, අදාළ විෂයය භාර අතිරේක ලේකම්වරයා පාලක සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (3) වන උපවගන්තියේ " 6 වන වගන්තියේ (උ) ඡේදය " යන වචන සහ ඉලක්කම් වෙනුවට " 6 වන වගන්තියේ (ඉ) ඡේදය හෝ (එ) ඡේද " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

---

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.